www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නර්තනය - (දේශීය) II நடனம் - (தேசிய) II Dancing - (Indigenous) II	52	S	II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

* **I** වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන, ප්‍රස්තාර කරන්න.

(අ) "තකුං ජිං ජිං තක ජිං ගත රුජිං කඩතක"
(ආ) "තක දිත් තක දොම් දොං දිං තකදොම්"
(ඇ) "ජිං ජිං තත් ජිමිතක ජිමිකත"

(ii) පහත සඳහන් කවි පදය මාත්‍රා තුනේ, තනි තිත්තේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"ඉපල් පිටින් ගහන අඩිව පිටට ඉහිරවන්නේ...

තාදිඟු තරි යේ දිඟු තරි ඒක එහෙම වන්නේ"

(iii) මයුරා වන්නමේ අඩවිව/ශුද්ධ තාලයේ ඉරට්ටිය/නාග ගජගා වන්නමේ අඩවිව ප්‍රස්තාර කරන්න.

2. "ශාන්තිකර්මවල දී සාම්ප්‍රදායික නර්තනවල ආවේණික ලක්ෂණ, විවිධතා හා සමානතා මෙන් ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යමාන වේ."

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා දෙවොල් මඬු ශාන්තිකර්මයන්හි නාට්‍යමය පෙළපාළිවල චරිත නිරූපණ අවස්ථා **දෙකක්** ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

(ii) සමාජ සම්බන්ධතා හා සාර්ධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) පුරාවෘත්ත මගින් හෙළි වන බෞද්ධාගමික පසුබිම හා සමාජ විශ්වාස සන්නියකුම යාගය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

3. අභිනය යන සංකල්පය දේශීය ශාන්තිකර්මවල ප්‍රාසංගික බව වර්ධනය කිරීමෙහිලා බෙහෙවින් බලපාන සාධකයක් වේ.

(i) කොහොඹා කංකාරියේ සතර අභින උපයෝගීතාව ඉහත පාඨය මගින් සාකච්ඡා කරන්න.

(ii) බලි ශාන්තිකර්මයේ ඇති සෞන්දර්යාත්මක වටිනාකම ආහාර්ය අභිනය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) දෙවොල් මඬුව හෝ පහන් මඬුව ශාන්තිකර්මයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා වාචික හා ආහාර්ය අභිනය යොදා ගන්නා ආකාරය නාට්‍යමය අවස්ථාවක් මගින් විමසීමට ලක් කරන්න.

II කොටස

4. දේශීය නර්තනය ව්‍යාප්ත කිරීමේ දී යුගාන්තර වශයෙන් විවිධ සාධක බලපා ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

(i) උඩරට වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව සපයන්න.

(ii) "නර්තන කලාවේ ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී දේශාටන වාර්තා ද වඩා වැදගත් වේ." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iii) ක්‍රි. ව. 1980 න් පසු දේශීය නර්තනයේ ඇති වූ සමාජීය වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. (i) සොකරි නාටකයේ එන චරිත **දෙකක්** නම් කර, එම එක් එක් චරිතයට භාවිත බෙර පදය හා කවිය බැගින් ලියන්න.

(ii) "ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන් ම, ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ." නිදර්ශනාත්මකව විග්‍රහයක් කරන්න.

(iii) කෝලම් චරිත නිරූපණය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය චරිත **දෙකක්** ඇසුරෙන් විශ්ලේෂණය කරන්න.

III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ),(ආ),(ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.

(අ) කොටස	(ආ) කොටස	(ඉ) කොටස
ශ්‍රීමති මේනකා	පදම්	පුංග් - පෙනා
රුක්මණී දේවී අරුන්ඩේල්	ලාසිහරෝබා	චෙන්ඩා - එඩැක්ක
බාලසරස්වතී	තෝඩායම්	මෘදංගම් - නටුවාංගම්
නවාබ් වජීඩ් අලීෂා	ගත් නිකාස්	පක්වාජ් - තබ්ලා

(i) (අ) අඩයාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය කවුද? ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ii) (ආ) කථකලි නර්තනයේ ශාස්ත්‍රීය නර්තන අංගය තෝරා, එම නර්තනය පිළිබඳ කරුණු දක්වන්න.

(iii) (ඉ) කථක් නර්තනය හා සබැඳි වාද්‍ය භාණ්ඩවල ව්‍යුහය හා ඒවායේ විශේෂතා ගෙනහැර දක්වන්න.

7. (i) රසභාව දැකිය හැකි අවස්ථාවක් රටයකුම හෝ සන්නියකුම ශාන්තිකර්මය ඇසුරෙන් විස්තර කරන්න.

(ii) බටහිර බැලේ (Ballet) සංකල්පය සහ දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය සංසන්දනය කරන්න.

(iii) නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරණයේ ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

IV කොටස

8. නව නර්තන කලාවේ ප්‍රවණතා දේශීය සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රවර්ධනයට බෙහෙවින් බලපා ඇත.

(i) සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට එක් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ii) නව ප්‍රවණතා හමුවේ සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කළ හැකි ද? මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(iii) "චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අතර අද්‍යතන නිර්මාණවල එය වඩාත් ඉස්මතු වේ." ඇගයීමක් කරන්න.

9. (i) පැරණි හා නූතන රංග භූමි අලංකරණය හා විවිධ ශිල්පක්‍රම පිළිබඳ තුලනාත්මක ව පිරික්සන්න.

(ii) දේශීය ශාන්තිකර්මවල රංගභූමි අලංකරණයේ දී භාවිත වන අමුද්‍රව්‍ය, වර්ණ හා සැරසිලි පිළිබඳ විමසුමක් කරන්න.

(iii) "අද්‍යතන වේදිකාවේ දක්නට ලැබෙන වෙස් මෝස්තර හා රංගාලෝකය, නිර්මාණාත්මක නර්තනයේ ප්‍රාසංගික බවට වඩාත් ඉවහල් වේ." විග්‍රහයක් කරන්න.

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.